දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2012 පරීක්ෂණය - 2014 දෙසැම්බර්
Bachelor of Arts General (External) Degree Part II 2012 Examination – December 2014

ආවිසා 3.1 - ප්‍රායෝගික ආර්ථික විද්‍යාව
ECG 3.1 - Applied Economics

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ)

---

01. (i) 1977 අග භාගයෙන් පසුව හඳුන්වාදුන් ලිහිල් ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කිරීමට සමත් වීම තහවුරු කිරීමට ප්‍රමාණවත් සාධක ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

(ii) 2004 න් පසු බලයට පත් නව රජය, රාජ්‍ය අංශය ශක්තිමත් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේ ද?

(ලකුණු 05)

(iii) මෑත කාලීනව මානව ප්‍රාග්ධනය වර්ධනය කිරීමට යොදා ගත් සංවර්ධන උපාය මාර්ග සාර්ථකත්වයක් අත්පත් කර ගැනීමට සමත් වූ ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

02. වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදුවූ ව්‍යුහාත්මක වෙනස්කම් පහත සඳහන් අවස්ථාවන් පාදක කොට, සාකච්ඡා කරන්න.

(i) කෘෂිකාර්මික අංශයේ දායකත්වය අඩුවීම

(ලකුණු 05)

(ii) කාර්මික හා සේවා අංශයේ දායකත්වය ක්‍රමයෙන් ඉහළ යාම

(ලකුණු 05)

(iii) සේවාභිමුඛ ආර්ථිකයක් (Service Oriented Economy) බවට ක්‍රමයෙන් පත්වීම

(ලකුණු 05)

(iv) ඉහළ මැදි ආදායම් ලබන රටක් (Upper - Middle Income Country) කරා ගමන් කිරීම

(ලකුණු 05)

03. 2009 වසරේදී ලබාගත් යුද ජයග්‍රහණයෙන් පසුව තිරසාර සහ වේගවත් ආර්ථික සංවර්ධනයක් කරා ශ්‍රී ලංකා ආර්ථිකය මෙහෙයවීමේ දී සෘජු විදේශීය ආයෝජනවල කාර්යභාරය පිළිබඳව විචාරාත්මක විග්‍රහයක යෙදෙන්න.

(ලකුණු 20)

04. (i) ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ගැටළුවේ ව්‍යුහාත්මක ලක්ෂණ කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ii) එම ලක්ෂණ තීරණය කිරීමෙහිලා තුඩු දුන් සාධක හඳුනාගෙන ඒවා සඳහා ඔබේ විසඳුම් ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

05. (i) කෘෂි කාර්මික ප්‍රතිපත්තියක අරමුණු මොනවා ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ii) වර්තමාන ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මාන්ත අංශයේ පවතින ගැටළු හඳුනාගෙන, එම ගැටළු විසඳා ගැනීම සඳහා රජය මැදිහත් විය යුතු ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

06. (i) ඔබ දුප්පත්කම අර්ථ දක්වන්නේ කෙසේද?

(ලකුණු 05)

(ii) ආර්ථික වෘද්ධිය දුප්පත්කම පහල යාමක් සහතික කරයි ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 07)

(iii) ශ්‍රී ලංකාව දරිද්‍රතාව අඩුකිරීම සඳහා 1977 න් පසු අනුගමනය කොට ඇති ක්‍රියා මාර්ගයන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

07. (i) සංවර්ධනය වෙමින් පවතින රටවල ක්‍රියාත්මක වන "පහත් මට්ටමේ සමතුලිතතා පාෂය" / උගුල) (Low Equilibrium Trap) යන සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ii) ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යා වර්ධනය ආශ්‍රිත මෑතකාලීන ප්‍රවනතාවයන් දක්වා ඊට ඉවහල් වී ඇති හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(iii) ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය වැඩි වීමේ ආර්ථික හා සමාජීය ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.

(ලකුණු 07)

08. (i) පිරිවැය - උද්ධමන සංකල්පය සහ ඉල්ලුම් උද්ධමන සංකල්පයන්හි විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) ශ්‍රී ලංකාවේ උද්ධමනය පාලනය කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

(ලකුණු 10)